
# සිංහල සාහිත්‍යයේ සුරවීර ලකුණ

**සාරාර්ථ රැසක් අපේ සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් කළ මහාචාර්ය ඒ.වී. සුරවීරයන් අප අතරින් වියෝවී මෙම මස 14 වැනිදට වසර නවයක් ගතවීම නිමිත්තෙන් මේ ලිපිය ලියැවේ. අනුරාධපුර සංස්කෘතිය, අනුරාධපුර සමාජය, විචාර විලාසය, නවකතා නිර්මාණය හා අවබෝධය, සාහිත්‍ය විචාර ප්‍රදීපිකා ආදී සිංහල ග්‍රන්ථ මෙන්මEssyas on sri lankan literature, Commeunication modes in Sinhala writing සහ ඉංග්‍රීසි බසින් රචිත තවත් විචාර ග්‍රන්ථත් පෑදි දියට බොර දිය, හෙයියංමාරුව, ගොදුරු ලොබ ආදී ප්‍රබන්ධ කෘතිත් පිඹිත් නලා සුරා මතින් ආදී පරිවර්තන ද පූජාවලිය, රාජාවලිය ආදී සංස්කරණ ඇතුළු විවිධ විෂයාංශ සහිත ග්‍රන්ථ රාශියක් එතුමා අතින් රසැයුණු ග්‍රන්ථ වංශයට අයත්ය.**

එතුමාගේ ‘අනුරාධපුර සංස්කෘතිය ග්‍රන්ථයට මුල්ම රාජ්‍ය සම්මානය හිමි විණි. අදත් සරසවිවල සාහිත්‍ය විචාර පාඨමාලාවල ලියෝතෝල්ස්තෝයි ගේ What is Art කෘතියෙහි පරිවර්තනය වූ “කලාව යනු කුමක්ද?” යන ග්‍රන්ථය ප්‍රමුඛ මූල ග්‍රන්ථයක් සේ භාවිත කෙරේ. එමෙන්ම එතුමා රචනා කළ “සමාජීය සාහිත්‍ය අධ්‍යයනය” කෘතිය විශ්වවිද්‍යාල විචාර පාඨමාලාවල වැදගත් විචාර ධාරාවක් සලකුණු කරයි.

වත්මනෙහි විවිධ අත්හද බැලීම් ඔස්සේ ප්‍රතිනිර්මාණය වන ප්‍රබන්ධ සාහිත්‍යයට සුගැඹුරු පදනමක් මහ ඇදුරු ඒ.වී. සුරවීරයන්ගේ නවකතා හා කෙටිකතා ඔස්සේ ලැබේ. නව විචාර ධාරාවක් වූ “නව ඉතිහාසවාදය (New historicism) යන්නෙහි ප්‍රමුඛ ආදර්ශයක් ලෙස මහ ඇදුරු ඒ.වී. සුරවීරගේ “සඳ මෙලෙස පුර දෙරණේ” යන්න සැලකිය හැකිය. අද වන විට



ඓතිහාසික විචාරය (Historical criticism) නමින් වර්ධනය වී ඇති සාහිත්‍ය විචාර ප්‍රවණතාව පිළිබඳව මහාචාර්ය ඒ.වී. සුරවීර තම සමාජීය සාහිත්‍ය විචාරයෙහි මූලික විවරණය ගෙන එයි. හිපලයිට් ටේන් (Hippolite tain) නම් විචාරකයා නිසා ආරම්භ වූ එහි වර්ධනීය අවස්ථාවක් ලෙස ඉතිහාසය ප්‍රතිනිර්මාණාත්මකව ඉදිරිපත්වීම වත්මනෙහි ප්‍රධාන සාහිත්‍ය මාදිලියක් වී ඇත. ඒ.වී. සුරවීරයන්ගේ සම්ප්‍රදය හා විචාරය කෘතියෙහි අන්තර්ගතය ද ඒ ක්ෂේත්‍රයට ඔහු කළ එවන් දයකත්වයකි. මේ කෘතිය රචනා වූයේ 1999දීය. එහි විෂයීක අන්තර්ගතය ඒ යුගයට වඩා වර්තමානයට බෙහෙවින් වැඩදයක බව ප්‍රබන්ධ උගන්වන හා විචාරයේ යෙදෙන සරසවි ඇදුරෙකු වශයෙන් මගේද හැඟීමයි. හෙන්රි ජේම්ස්ගේ The art of fiction යන ලිපිය ඇතුළු ටී.එස්. එලියට්, ජෝර්ජ් ලූකාස්, රේමන්ඩ් විලියම්ස් ආදී විචාරකයන්ගේ ලිපි එහි ඇතුළත්ය. වත්මනෙහි විශ්ව විද්‍යාල සාහිත්‍ය පාඨමාලා අතරෙහි නිර්මාණ රචනය හා අධ්‍යයනය යන විෂයයන් උගන්වන හා අධ්‍යයනයෙහි යෙදෙන ගුරු සිසු දෙපක්ෂයටම මෙම ලිපි වැදගත් බව මගේ හැඟීමයි.

සාහිත්‍ය විචාරයෙහි මූල ධර්ම, සාහිත්‍ය විචාරය හා එයට බලපාන විවිධ විෂයීක කරුණු මෙන්ම විචාරකයා සතු විය යුතු ආචාරධර්ම පිටු දැකීම මේ යුගයේ තැන තැන දක්නට ලැබෙන කුලගොත් ගටමින් මිනිසුනට දරුණු පෞද්ගලික සෝපහාස සිදු කරන විචාරකයන් දෙස බලන විට පෙනේ. මේ නිසාදෝ මහාචාර්ය ඒ.වී. සුරවීර වරක් පුවත්පතකට කළ ප්‍රකාශයක දී “විචාරකයා යනුවෙන් අපක්ෂපාතී මිනිසෙකු අද දක්නට නැතැ” යි සඳහන් කළේය. 1960 සිට 2014 දක්වා දශක පහකුත් වසර හතරක් පුරා සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයට සිංහල විචාර ධාරාවට හා ශාස්ත්‍රීය ග්‍රන්ථ ක්ෂේත්‍රයට අනුපමේය සේවයක් සිදු කළ මහ ඇදුරු ඒ.වී. සුරවීර 2014හි ජනවාරි මස 13 වන දින රාත්‍රී 9.30 පමණ වන තුරු ඔහුම කලින් ලියූ ඉංග්‍රීසී ලේඛනයක් සිංහල බසට පරිවර්තනය කරමින් සිටි බව ඔහුගේ බෑනණුවන් වූ වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි මා සමඟ පැවසීය. අවසානයේ ලියමින් සිටි බෝල්පොයින්ට් පෑනද ලේඛනය මත රඳවා නින්දට ගිය ඔහු නැවත අවදි නොවීය. 14 වන ද අලුයම ඔහුගේ අභාවය සිදුවූයේ නින්දේදීම වැළඳුණු හෘදයාබාධයකිනි. තම දිවියේ අඩසිය වසකටත් වැඩි කාලයක් පුරා ශාස්ත්‍රීය සේවයකට කැප කොට තම මරණයට පැය කිහිපයකට පෙරත් එහිම නියැළෙමින් සිට මිය ගිය එතුමාගේ නාමය මේ රටේ උදර ශාස්ත්‍රවන්තයන්ගේ නාමාවලියට නිතැතින් එකතු වනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨ
මහාචාර්ය
**සාලිය කුලරත්න**